Archaeological Society of Srilanka

# පුරාවිදු පුවත්

ශ්‍රී ලංකා පුරාවිද්‍යා සංගමයේ පුවත් හසුන

15 වෙළුම
2 කලාපය
2019
ජුනි-අගෝස්තු

## ශ්‍රී ලංකා පුරාවිද්‍යා සංගමයේ 53 වැනි වාර්ෂික මහා සභා රැස්වීම

ශ්‍රී ලංකා පුරාවිද්‍යා සංගමයේ 53 වන වාර්ෂික මහා සභා රැස්වීම 2019.04.07 වැනි දින පෙරවරුවේ කොළඹ ජාතික කෞතුකාගාර ශ්‍රව්‍ය දෘශ්‍ය මැදිරියේ දී පවත්වන ලදි.

ගරු සභාපති මහින්ද මලලසේකර මහතා විසින් සභාව පිළිගැනීමෙන් අනතුරුව සභාවේ කටයුතු ආරම්භ විය. 2018 වර්ෂයේ පැවැති 52 වන වාර්ෂික මහා සභා රැස්වීමේ වාර්තාව ගරු ප්‍රධාන ලේකම් මුදිත කරුණාමුනි මහතා විසින් ඉදිරිපත් කරන ලදි. එය සත්‍ය වාර්තාවක් බවට යෝජනා ස්ථිරත්වයෙන් සභා සම්මත විය.

2018/2019 වර්ෂය (53 වැනි වර්ෂය) සඳහා වූ සංගමයේ ප්‍රගති වාර්තාව ඉන් පසු සභාගත කරන ලදි. එහි 2018 සිට 2019 දක්වා කාලය තුළ සංගමය මගින් සිදුකරන ලද කටයුතුවල ප්‍රගතිය, නව සාමාජිකයන්, අනුමත වූ ව්‍යවස්ථා සංශෝධන, මාසික දේශන, පුරාවිදු පුවත් පුවත්හසුන, ප්‍රකාශන, දෙවන පර්යේෂණ සම්මන්ත්‍රණය, පර්යේෂණ ක්‍රමවේද හඳුන්වාදීමේ වැඩමුළුව, කෞතුකාගාර චාරිකා වැඩසටහන, සංගමයේ පැතිකඩ, වෙබ් අඩවිය, Google හා Facebook කණ්ඩායම් විස්තර, වෙනත් සංගම්වල සාමාජිකත්වය, පාර්ලිමේන්තු පනතක් මගින් සංගමය සංස්ථාපනය කිරීම හා විධායක සභිකයන්ගේ පැමිණීම යන තොරතුරු ඇතුළත් විය.

සංගමයේ 2018 වර්ෂය සඳහා වූ, ගණන් පරීක්ෂක විසින් අනුමත කරන ලද වාර්ෂික ගිණුම් වාර්තාව සභාගත කරන ලද්දේ ගරු භාණ්ඩාගාරික ලක්ෂ්මන් රත්නායක මහතා විසිනි. එයද යෝජනා ස්ථිරත්වයෙන් සභා සම්මත විය.

විධායක සභාව විසින් ඉදිපත් කරන ලද ව්‍යවස්ථා සංශෝධන යෝජනා දෙකක් සභාව විසින් ස්ථිර කරන ලදි. (පිටුව 2 බලන්න)

ඉන්පසුව එළැඹියේ නව නිලධාරි මණ්ඩලය සඳහා ඉදිරිපත්ව ඇති යෝජනාව සම්මත කිරීමයි. විධායක සභාව විසින් ඉදිරිපත් කරන ලද නාමයෝජනා සාමාජිකයන් වෙත දැනුම්දී තිබූ අතර, වෙනත් නාමයෝජනා නොතිබූ බැවින්, එම යෝජනාව සාමාජිකත්වය විසින් පිළිගන්නා ලදි.

2 වන පිටුවට ⇨

## එක් දින අධ්‍යයන චාරිකාව - ජුනි 22 වන සෙනසුරාදා

දකුණු පළාතේ පිහිටි වැදගත් පුරාවිද්‍යා ස්ථාන නැරඹීම සඳහා ජුනි මස 22 වන සෙනසුරාදා එක් දින අධ්‍යයන චාරිකාවක් සංවිධානය කිරීමට විධායක සභාව තීරණය කර ඇත. එදින පෙ.ව. 6ට මහවැලි කේන්ද්‍රය අසලින් පිටත්වීමට නියමිතය. මේ චාරිකාවේදී පහත සඳහන් ස්ථාන නැරඹීමට අපේක්ෂිතය.

- මුල්කිරිගල රජමහා විහාරය - මහාචාර්ය චන්ද්‍රා වික්‍රමගමගේ මහතා විසින් එහිදී ශාස්ත්‍රීය දේශනයක් කිරීමට නියමිත බවද සතුටින් දැනුම් දෙමු.
- කසාගල රජමහා විහාරය
- නයිගල රජමහා විහාරය

ඒ සඳහා සහභාගිවීමට කැමති සාමාජිකයන් 2019 ජුනි 09 මාසික ශාස්ත්‍රීය දේශනය පැවැත්වෙන දින ගරු සම්බන්ධීකරණ ලේකම් සංජීවනී විද්‍යාරත්න මහත්මියට දැනුම් දෙන මෙන් ඉල්ලමි (දුර- 071-5872591). උදේ සහ දිවා ආහාර ඇතුළත්ව ගමන සඳහා මූලික වියදම රු 2000 ක් පමණ වෙතැයි අපේක්ෂා කරන්නෙමු. ජුනි 09 වන දින චාරිකාව සඳහා සහභාගි වන්නන් අත්තිකාරම් මුදලක් ගෙවා තම ආසනය වෙන්කර ගත යුතුය. (එම අත්තිකාරම් මුදල නැවත ආපසු ලබාදෙනු නොලැබෙන බවද කාරුණිකව දැනුම් දෙමු)

## මාසික වැඩසටහන්

ශ්‍රී ලංකා පුරාවිද්‍යා සංගමයේ මාසික වැඩසටහන් මාලාව යටතේ මීළඟ මාස තුන ඇතුළත පැවැත්වීමට නියමිත වැඩසටහන් මෙසේය.

- **ජුනි 09 ඉරිදා ප.ව. 2.30ට**

  දේශන මාතෘකාව:
  යටත් විජිත ලංකාවේ වාස්තු විද්‍යාව
  දේශක:
  ඇෂ්ලි ද වොස් මහතා (වරලත් වාස්තු විද්‍යාඥ, සභාපති ශ්‍රී ලංකා රාජකීය ආසියාතික සමිතිය)

- **ජූලි 14 ඉරිදා ප.ව. 2.30ට**

  දේශන මාතෘකාව:
  සීගිරියේ නිර්මාණකරණය සඳහා පාෂාණ උපයෝගීතාව
  දේශක:
  ආචාර්ය කුසුම්සිරි කොඩිතුවක්කු මහතා (කෞතුකාගාර පාලක, ජේතවන කෞතුකාගාරය හා බාහිර කථිකාචාර්ය, රජරට විශ්ව විද්‍යාලය)

- **අගෝස්තු 11 ඉරිදා ප.ව. 2.30ට**

  දේශන මාතෘකාව:
  ශ්‍රී ලංකාවේ සත්ත්ව පුරාවිද්‍යාත්මක නව අනාවරණ
  දේශක:
  කැලුම් නලින්ද මනමේන්ද්‍රආරච්චි මහතා (පුරාඅස්ථි විශේෂඥ, පුරාවිද්‍යා පශ්චාත් උපාධි ආයතනය, කැලණිය විශ්ව විද්‍යාලය)

**ඉහත දේශන කොළඹ 7, ආනන්ද කුමාරස්වාමි මාවතේ, අංක 96 දරණ තැන පිහිටි රාජකීය ආසියාතික සමිතියේ රැස්වීම් ශාලාවේදී පැවැත්වේ. (මහවැලි කේන්ද්‍ර ගොඩනැගිල්ලේ පළමු මහලේ)**

- **දේශන පැවැත්වෙන දිනවල ප.ව. 1.00ට සංගමයේ විධායක සභා රැස්වීම පැවැත්වේ. ඒ සඳහා ගරු විධායක සභිකයින්ගේ පැමිණීම අපේක්ෂා කරමු.**

# ශ්‍රී ලංකා පුරාවිද්‍යා සංගමයේ ..... (1 පිටුවෙන්)

ඒ අනුව 2019/2020 වර්ෂය සඳහා විධායක සභාව සඳහා පත් වූ නව නිලධාරි මණ්ඩලය මෙසේය.

| | | |
|---|---|---|
| ගරු සභාපති | : | මහින්ද පී. මලලසේකර |
| ගරු ජ්‍යෙෂ්ඨ උප සභාපති | : | ආචාර්ය කාවන් රත්නතුංග |
| ගරු උපසභාපති | : | නීතිඥ ජිමී මාරඹේ |
| ගරු ප්‍රධාන ලේකම් | : | මුදිත කරුණාමුනි |
| ගරු සම්බන්ධීකරණ ලේකම් | : | සංජීවනී විද්‍යාරත්න |
| ගරු සහකාර ලේකම් | : | යොහාන් ෆෙරෙයිරා |
| ගරු භාණ්ඩාගාරික | : | ලක්ෂ්මන් රත්නායක |
| ගරු සංස්කාරක | : | රුක්ෂිලා වෙත්තමුණි |
| ගරු විධායක සභිකවරු (11) | : | ධනේෂ් විසුම්පෙරුම |
| | | බෙනට් ප්‍රනාන්දු |
| | | බන්දු වීරවර්ධන |
| | | හේමතිලක බණ්ඩාර |
| | | සී. එච්. ඉද්දගොඩ |
| | | සිරිල් ආරියපාල |
| | | නාමල් ගුණසිංහ |
| | | නීතිඥ රවී තිලකවර්ධන |
| | | චන්දන උපාලි පෙරේරා |
| | | කුසුමබන්දු සමරවික්‍රම |
| | | ආචාර්ය ඉරංගා සමින්දනී වීරක්කොඩි |

ඉන්පසුව ගරු සභාපති මහින්ද පී. මලලසේකර මහතා සභාව ඇමතූ අතර, ගරු ප්‍රධාන ලේකම් වන මුදිත කරුණාමුනි මහතා ස්තුති කතාව සිදුකළේය.

ඒ සමඟ ශ්‍රී ලංකා පුරාවිද්‍යා සංගමයේ 53 වන වාර්ෂික මහා සභා රැස්වීමේ කටයුතු සමාප්ත විය.

ශ්‍රී ලංකා පුරාවිද්‍යාවේ නව සොයාගැනීම් යන මැයෙන් වූ මුඛ්‍ය දේශනය පුරාවිද්‍යා පශ්චාත් උපාධි ආයතනයේ ජ්‍යෙෂ්ඨ මහාචාර්ය රාජ් සෝමදේව මහතා විසින් මහා සභා රැස්වීමට පෙර පවත්වන ලදි.

## සම්මත වූ ව්‍යවස්ථා සංශෝධන යෝජනා

### සංශෝධිත වගන්තිය 1

7 (ඈ.) (1). විධායක සභාවට පත්වන්නෙක් පෙර වසරේ විධායක සභාවේ සාමාජිකත්වය දැරුවේ නම්, ඒ නිල කාලය තුළ පැවති විධායක සභා රැස්වීම්වලින් අවම වශයෙන් සියයට 50කට සහභාගි වී තිබිය යුතුය.

(2). 7 (අ) 1 සිට 8 දක්වා සඳහන් නිලයකට පත් නොවන්නේ නම්, 7 (අ) 9 යටතේ එන විධායක සභිකයන් අතරින් අඛණ්ඩව වර්ෂ 3ක සේවා කාලයක් සම්පූර්ණ කරනු ලබන අයගෙන් උපරිම වශයෙන් පස්දෙනෙකු, එළැඹෙන වර්ෂයක කාලයක් සඳහා සංගමයේ විධායක සභාවෙන් අනිවාර්යයෙන්ම ඉවත්ව සිටිය යුතුය. එසේ ඉවත්වන්නන් තීරණය කරනු ලබන්නේ ස්වකැමැත්තෙන් ඉවත්වන අය හා අවම පැමිණීම ඇති පිරිස අතරිනි. එසේ තීරණය කළ නොහැකි අවස්ථාවකදී විධායක සභාවේ රහස් ඡන්දයකින් තීරණය කළ හැකිය. (මෙම වගන්තිය යටතේ සිදුකරන ධූර කාල ගණනය කිරීම 2019 වර්ෂයේ මාර්තු මස පැවැත්වෙන 53වන වාර්ෂික මහාසභා රැස්වීමේ සිට ක්‍රියාත්මක විය යුතුය.)

### සංශෝධිත වගන්තිය 2

7 (ඌ.) අනු කමිටු: ස්ථාවර අනු කමිටු දෙකක්ද (1. විශේෂ ව්‍යාපෘති අනු කමිටුව 2. සංවර්ධන අනු කමිටුව), විධායක සභාව විසින් යෝග්‍ය යැයි තීරණය කරනු ලබන කටයුතු සඳහා වන තත්කාර්ය අනු කමිටුද පිහිටුවීමට විධායක සභාවට බලය තිබේ. මෙම අනු කමිටු සඳහා විධායක සභාවෙන් කැඳවුම්කරුවකුද, නිල බලයෙන් ගරු ප්‍රධාන ලේකම්ද, තවත් විධායක සභිකයන් තුන් දෙනෙකුද, අවශ්‍ය නම් විධායක සභිකයන් නොවන සාමාජිකයන් දෙදෙනෙකුද ඇතුළුව හත් (7) දෙනෙකුගෙන් සමන්විත විය හැක.

# 3 වන
# පුරාවිද්‍යා හා ඉතිහාස පර්යේෂණ සම්මන්ත්‍රණය 2019
## 2019 නොවැම්බර් මස කොළඹදී පැවැත්වේ
### සංවිධානය - ශ්‍රී ලංකා පුරාවිද්‍යා සංගමය

## පර්යේෂණ පත්‍රිකා කැඳවීම

**විෂය - ශ්‍රී ලංකාවේ පුරාවිද්‍යාව හා ඉතිහාසයට අදාළ ඕනෑම විෂයයක්**

**මාධ්‍යය - සිංහල හා ඉංග්‍රීසි**

### සාරාංශ සඳහා මාර්ගෝපදේශ

- වචන 1000-1200 අතර ප්‍රමාණයේ විස්තීර්ණ සාරාංශයක් (extended abstract) ඉදිරිපත් කළ යුතුය.
- සියලු විස්තීර්ණ සාරාංශ MS WORD ලේඛනයක් ලෙස සකස් කළ යුතුය.
- භාවිත කළ යුතු අකුරු වර්ග හා පිටු සැකසුම පිළිබඳ කරුණු
  - සිංහල - FM Abhaya හෝ යුනිකෝඩ් සිංහල අකුරු
  - ඉංග්‍රීසි - Times New Roman
  - අකුරු ප්‍රමාණය - 12 point
  - පේළි අතර ඉඩ - 1.5
- කර්තෘ හෝ කර්තෘවරුන් පිළිබඳ පහත සඳහන් විස්තර ඇතුළත් කළ යුතුය
  - නම/ නම්
  - තැපැල් ලිපිනය
  - විද්‍යුත් තැපැල් ලිපින
  - දුරකථන අංක
  - සේවය කරන ආයතන (ඇත්නම්)
- මුඛ්‍ය පද (keywords) 5ක් සඳහන් කළ යුතුය.
- විස්තීර්ණ සාරාංශයට අදාළ වන ප්‍රධාන මූලාශ්‍ර ඇතුළත් කළ හැකිය.

**සාරාංශ එවිය යුතු ලිපිනය -** asslconf@gmail.com (විද්‍යුත් තැපැල් මගින් පමණි.)

**වැදගත් දින**

සාරාංශ එවිය යුතු අවසන් දිනය - 2019 අගෝස්තු 15
සාරාංශ පිළිගත් බව දැනුම් දෙන දිනය - 2019 අගෝස්තු 31
සම්පූර්ණ පත්‍රිකාව ලබා දීම හා ලියාපදිංචිය - 2019 ඔක්තෝබර් 20 දිනට පෙර

**ලියාපදිංචි වීමේ ගාස්තු -** මීට පත්‍රිකා එකතුව, දිවා ආහාර හා තේ පැන් ඇතුළත්ය

පත්‍රිකා ඉදිරිපත් කරන්නන් රු. 1200/=
සහභාගි වන්නන් සඳහා රු. 1000/=

## ශ්‍රී ලංකා පුරාවිද්‍යා සංගමයේ ලිපිනය හා දුරකථන අංක


ලිපිනය - සම්බන්ධීකරණ ලේකම්
ශ්‍රී ලංකා පුරාවිද්‍යා සංගමය
ජාතික කෞතුකාගාරය බාරේ
ශ්‍රීමත් මාකස් ප්‍රනාන්දු මාවත
කොළඹ 07.

විද්‍යුත් තැපැල -
archaeology.org.lk@gmail.com
වෙබ් අඩවිය -
www.archaeology.org.lk

- ගරු සභාපති
  මහින්ද පී. මලලසේකර 072-3322411
- ගරු ජ්‍යෙෂ්ඨ උප සභාපති
  ආචාර්ය කාවන් රත්නතුංග 071-7072020
- ගරු උප සභාපති
  නීතීඥ ජිමී මාරඹේ 071-1190727
- ගරු ප්‍රධාන ලේකම්
  මුදිත කරුණාමුනි 071-2287497
- ගරු සහකාර ලේකම්
  යොහාන් පෙරෙයිරා 077-9651201
- ගරු සම්බන්ධීකරණ ලේකම්
  සංජීවනී විද්‍යාරත්න 071-5872591
- ගරු භාණ්ඩාගාරික
  ලක්ෂ්මන් රත්නායක 077-7985543
- ගරු සංස්කාරක
  රුක්ෂිලා වෙත්තමුණි 071-2097055


## නිවේදන

- සාමාජික අයදුම්පත් සංගමයේ වෙබ් අඩවියෙන් PDF ලේඛනයක් ලෙස බාගත කළ (download) හැකිය.
- අපගේ Google කණ්ඩායමේ ඊමේල් පණිවුඩ නොලැබේද? එසේ නම් ඔබේ නම, ලිපිනය හා සාමාජික අංකය සඳහන් කළ SMS පණිවුඩයක් ගරු සහකාර ලේකම් යොහාන් පෙරෙයිරා වෙත 077-9651201 අංකයට යොමු කරන්න.

## පුරාවිදු පුවත් සංස්කරණය

රුක්ෂිලා වෙත්තමුණි
ගරු සංස්කාරක
rukshilawettamuni@gmail.com

# සංගමයේ නිවේදන

__සංගමයේ අරමුදල වෙනුවෙන් මූල්‍යමය පරිත්‍යාග__

පුරාවිද්‍යා සංගමය ස්වේච්ඡා සංවිධානයක් වන බැවින් එහි පැවැත්ම උදෙසා ඔබට හැකි අයුරින් මුදලින් පරිත්‍යාග කළ හැකිය. ඔබගේ පරිත්‍යාග මත සංගමයේ කටයුතු විධිමත් ලෙස සංවිධානය කිරීමට අපට හැකි බව කාරුණිකව දන්වමි.

ඔබේ පරිත්‍යාග සංගමයේ රැස්වීම්වලදී මුදලින් ලබාදිය හැකිය.

බැංකුගත කරන්නේ නම් පහත දැක්වෙන සංගමයේ ජංගම ගිණුමට බැරකර බැංකු ආකෘතිපත්‍රය ඔබගේ නම සඳහන් කර අපගේ archaeology.org.lk@gmail.com ලිපිනයට ඊමේල් කිරීමට හෝ පැමිණ ලබාදීමට හැකිය.

ගිණුම් අංකය - **014-1-001-1-0112875**

ගිණුමේ නම - ශ්‍රී ලංකා පුරාවිද්‍යා සංගමය
Archaeological Society of Sri Lanka

බැංකුව - මහජන බැංකුව, යූනියන් පෙදෙස ශාඛාව
(Peoples Bank, Union Place Branch)

## අලෙවිය සඳහා ඇති සංගමයේ ප්‍රකාශන

**ශ්‍රී ලංකා පුරාවිද්‍යා සංගමය 1966-2016: පණස් වසරක ඉතිහාසය -**
මිල රු .300 (සාමාන්‍ය මිල රු .350)

**ශ්‍රී ලංකා පුරාවිද්‍යා සංහිතා**
- වෙළුම 7 (2017) - රු. 200 (සාමාන්‍ය මිල රු. 250)
- වෙළුම 6 (2016) - රු. 200 (සාමාන්‍ය මිල රු. 250)
- වෙළුම 3 (2008) - රු. 120 (සාමාන්‍ය මිල රු. 170)
- වෙළුම 2 (2006) - රු. 120 (සාමාන්‍ය මිල රු. 150)

**වෙනත්**
- සංගමයේ ස්වර්ණජයන්ති සමරු මුද්දර කවරය - රු. 50
- සංගමයේ ස්වර්ණජයන්ති සමරු මුද්දරය - රු. 15


**පුරාවිදු පුවත්** - ශ්‍රී ලංකා පුරාවිද්‍යා සංගමයේ සාමාජිකත්වය වෙනුවෙන් පළකෙරෙන පුවත් හසුනයි.



**ආපසු:**
සංජීවනී විද්‍යාරත්න
සම්බන්ධීකරණ ලේකම් - ශ්‍රී ලංකා පුරාවිද්‍යා සංගමය
ජාතික කෞතුකාගාරය බාරේ
ශ්‍රීමත් මාකස් ප්‍රනාන්දු මාවත
කොළඹ 07.